**කළුතර නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

-----------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 01 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

-----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 02 අනුව අවසන් ගිණුම සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත් එය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ලැබී තිබූ ඩබල් කැබ් රථය සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවා තිබූ රු.706,273 ක් වූ වාරික මුදල් පමණක් ප්‍රාග්ධන වැය ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කළ යුතු වුවත් කැබ් රථයේ සම්පූර්ණ වටිනාකම වර්ෂයේ උපකරණ වැය ගිණුමට හර කර ප්‍රාග්ධනය යෙදුමට අදායමින් දායක වීමේ ගිණුම බැර කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.

(ආ) වැය ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයේදී රු.186,700 කට මිලදී ගෙන තිබූ CCTV යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) 2013 ජුලි 31 දින රු.63,000 කට මිලදී ගෙන තිබූ ලී බඩු, ගබඩා අත්තිකාරම් ගිණුමට ගිණුම් ගත කිරීම නිවැරදි කිරීම සඳහා යොදා තිබූ ජර්නල් සටහන මඟින් රු.63,000 ක් ලී බඩු හා උපකරණ ගිණුම හර කර ගබඩා අත්තිකාරම් ගිණුම බැර කිරීම වෙනුවට ගබඩා අත්තිකාරම් ගිණුම හර කර ලීබඩු හා උපකරණ වැය ගිණුම බැර කර තිබීම නිසා ලී බඩු හා උපකරණ වැය ගිණුමේ හා ගබඩා අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.126,000 කින් අඩුවෙන් දැක්විණි.

(ඇ) 2013 ජනවාරි 24 දින වවුචර් අංක 268 න් මුදල් ගිණුම රු.666,656 ක්ද, තැන්පත් ගිණුම රු.65,487 ක්ද, වෙනත් ආදායම් ගිණුම රු.19,323 ක්ද බැර කර ණයහිමි ගිණුම රු.654,872 ක්ද, එකතු කළ අගය මත බදු ගිණුම රු.96,584 ක්ද හර කර සටහන් කර තිබූ ගෙවීම් වවුචරය අවලංගු කර එම ගිණුම් සටහන් ආපසු ගැලපීමේදී ණයහිමි ගිණුම රු.654,872 ක් බැර කිරීම වෙනුවට රු.666,656 ක් බැර කිරීම නිසා වූ වෙනස නිවැරදි කිරීමේදී රු.11,774 ක් ණයහිමි ගිණුම හර කිරීම වෙනුවට එම වටිනාකම සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 23,277,898 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,278,832 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,393,240 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 23,267 | 13,762 | 24,885 |
| (ii.) | බදු කුලී | 212 | 412 | (200) |
| (iii.) | බලපත්‍ර ගාස්ත | 320 | 313 | 14 |
| (iv.) | වෙනත් ආදායම් | 11,923 | 8,718 | 6,592 |

2:2:2 වරිපනම් බදු

2013 දෙසැම්බර් 30 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.27,305,455 ක් වූ අතර ඉන් රු.5,000 ට වැඩි බදුහිමියන් 606 දෙදෙනෙකුගෙන් රු.14,526,655 ක ශේෂයක් හිඟව පැවතිණි. එම ශේෂය තුළ අවු. 5 ට වැඩි රු.11,915,112 ක ශේෂයක් වූ අතර එය 2013 දෙසැම්බර් මාසය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:3 බදු කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බඩු ගබඩා පාර නව වෙළඳ සැලෙහි කඩකාමර 02 කින් රු.98,300 ක් ද, නව සාප්පු සංකීර්ණයේ බිම් මහල, පළමු මහල හා උඩු මහලේ කඩ කාමර 12 කින් රු.60,700 ක් ද බස් නැවතුම්පල උඩු මහලේ එක් කඩ කාමරයකින් රු.9,000 ක් හා පැරණි වෙළඳ සැළෙහි කඩ කාමර 7 කින් රු.356,875 ක් ද ජුනි 30 දින වන විටත් හිඟව පැවතුණි.

(ආ) නව වෙළඳසැලෙහි අංක B1 ශාලාව, C හා B2 ශාලාව 1998 සිට 2001 දෙසැම්බර් 19 දක්වා ස.තො.ස. ආයතනය වෙත කුලියට දී ඇති අතර එම කඩ කාමර වලට අදාලව රු.268,668 ක හිඟ කුලී ශේෂය විගණිත දින වන 2013 දෙසැම්බර් 06 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) එකතුව රු.132,400 ක් වූ කුලි හිඟව පැවතිම නිසා නව සාප්පු සංකීර්ණයේ බිම් මහලෙහි කඩකාමර 5 ක් 2013 ජුලි 17 දින මුද්‍රා තබා තිබූ අතර හිඟ කුලිය අයකර ගැනීමෙන් තොරව සභාපතිගේ නියෝගය මත එම කඩකාමර එදිනව විවෘත කර තිබුණි.

(ඈ) සභාව සතුව පවතින කඩ කාමර කුලියට ලබාදිම සඳහා වූ ගිවිසුම් 1986 හා ඊට පෙර වර්ෂ වලදි එළඹී ගිවිසුම් වූ අතර එකී කිසිදු ගිවිසුමක් අළුත් කිරිමට 2013 නොවැම්බර් මාසය දක්වාත් කටයුතු කර නොතිබුණි.

(ඉ) 1980 දෙසැම්බර් 03 දිනැති අංක 1980/46 දරන බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 7 ඡේදය පරිදි බදුකරුට ව්‍යාපාරය පවත්වාගෙන යා නොහැකි යැයි හැඟෙන අවස්ථාවක හෝ බදුකරු මිය ගිය අවස්ථාවක ඔහුගේ/ඇයගේ කාලත්‍රයාට හෝ දරුවෙකුට එම කඩ කාමරයේ අයිතිය සභා සම්මුතියකට යටත්ව පැවරිය හැක. එසේම බදුකරුවන් විසින් කඩකාමර අතුරු බදුදීම සම්පූර්ණයෙන් තහනම් වන අතර අතුරු බද්දට දී ඇති අවස්ථාවක දී බදුකරුගේ බලපත්‍රය/බද්ද අවලංගු කළ යුතු බව දක්වා තිබියදි හා කඩ කුලී ගිවිසුමේ 11 වගන්තිය අනුව කුලියට ලබා දී ඇති කඩ කාමර අතුරු බදු දිම සිදු නොකළ යුතු බව සඳහන්ව තිබියදි සභාව සතු කඩකාමර 75 ක් අතුරු බදු දී තිබූ බව සභාව විසින් 2012 මාර්තු 19 දින අනාවරණය කරගෙන තිබුණ ද ඒවා සභාව විසින් නැවත පවරා ගෙන ටෙන්ඩර් කිරිමට විගණිත දිනය වූ 2013 දෙසැම්බර් 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 ජුනි 30 වන විට තොටුපල හන්දිය මාළු වෙළඳසැල් 6 කින් රු.91,800 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මෙම හිඟ ශේෂයන් මාස 10 සිට වසර 9 දක්වා වූ කාලයකට අයත් විය.

(උ) සිකුරාදා පොළ අංක 2 එළ හරක් මස් වෙළඳසැල 2013 අප්‍රේල් මස මුද්‍රා තබා සභාවට පවරාගෙන ඇතත් විගණිත දිනය වූ 2013 නොවැම්බර් 30 වන විටත් නැවත ටෙන්ඩර් කිරිම සිදු කර නොතිබුණි.

(ඌ) 2014 ජුලි 31 දිනට නීතිඥවරුන් වෙත බදු දී තිබූ කඩකාමර 02 කින් රු.105,350 ක හිඟ ශේෂයක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. මෙම හිඟ ශේෂය අවුරුදු 1 සිට අවුරුදු 7 ක කාල පරාසයකට අදාල විය.

2.2.4 බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු

-----------------------------------------------

2013 වර්ෂයට අදාලව ව්‍යාපාර 06 කින් රු.5,500 ක් වූ බලපත්‍ර ගාස්තුද, ව්‍යාපාර 02 කින් කර්මාන්ත බදු රු.1,300 ක් ද ව්‍යාපාර 187 කින් ව්‍යාපාර බදු රු.336,800 ක්ද 2014 ඔක්තෝබර් 30 වන විටත් හඟව පැවතුණි.

2:2:5 වෙනත් ආදායම්

-----------------

බල ප්‍රදේශයේ සවි කර තිබූ දැන්වීම් පුවරු 14 ක් වෙනුවෙන් 2012 හා 2013 වර්ෂ සඳහා අයවිය යුතු රු.736,539 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු 2013 නොවැම්බර් 30 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
--------------------------------------------------------------------

(අ) ගමන් වියදම්
----------------

(i) සභාපතිවරයා විසින් යම් ගමන් වියදම් හෝ සංයුක්ත දීමනාවක් ලබා ගැනීමේදී එම ගමනට අදාල කාර්යය යම් තීරණයක් මගින් සභාපතිවරයාට පැවරු කාර්යයක් බවට හෝ සභාවේ පරිපාලන කාර්යයක් සඳහා වූ ගමන් බවට හෝ එම ආයතන මගින් සභාපතිවරයා කැඳවූ අවස්ථාවක් ලෙසට තහවුරු කෙරෙන සාක්ෂියක් ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමෙන් තොරව සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය තුළ දින 107 ක් සඳහා රු.52,865 ක් සංයුක්ත දීමනා වශයෙන් ලබාගෙන තිබුණි.

(ii) එක් නාගරික මන්ත්‍රීවරයෙකුගේ නිවාස දුරකථනය සඳහා මාසිකව උපරිම සීමාව දක්වා වූ දුරකථන ගාස්තු ගෙවා තිබියදි තවදුරටත් රු.15,019 ක හිඟ ශේෂයක් පැවතිම නිසා 2013 අප්‍රේල් මාසයේ සිට දුරකථනය විසන්ධි කර තිබූ අතර සභාව විසින් 2013 නොවැම්බර් 05 දිනැති මහා සභා තීරණයක් අනුව එම මුදල ගෙවිමට අනුමත කර ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) 2012 හා 2013 වර්ෂයන්හි සභාවේ ලේකම් තනතුරේ දුරකථන වියදම් ප්‍රතිපූර්ණයන් සම්බන්ධයෙන් පහත නිරික්ෂණ කරනු ලැබේ.

(i) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නිවාස දුරකථන බිල්පත් පියවිම සඳහා හිමිකම් නොලබන නිලධාරින් වෙනුවෙන් චක්‍රලේඛයේ 4.3.1(vii) ඡේදය ප්‍රකාරව රජයේ වියදමින් දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු විය. එසේ වුවද පළාත් පාලන ආයතන නිලධාරින් සඳහා මෙම චක්‍රලේඛය යටතේ ගෙවීම් කිරීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සභාවේ හිටපු ලේකම්වරයාගේ කාර්යාලීය, නිවාස හා ජංගම දුරකථන වියදම් වෙනුවෙන් 2012 ජනවාරි සිට 2013 පෙබරවාරි දක්වා රු.52,045 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ii) එසේම ඉහත චක්‍රලේඛය පදනම් කරගෙන වර්තමාන ලේකම්වරයාගේ කාර්යාලය නිවස හා ජංගම දුරකථන වියදම් වෙනුවෙන් මාසිකව රු.4,000 ක සීමාව යටතේ 2013 මාර්තු සිට දෙසැම්බර් දක්වා රු.27,128 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(iii) විගණිත දිනය වූ 2014 ජනවාරි 15 දින වන විටත් සභාවේ හිටපු ලේකම්වරයා විසින් සභාවේ ලේකම් නිල නිවස පාවිච්චි කරනු ලබන අතර එම නිල නිවාසයේ 2013 දෙසැම්බර් 30 දිනට හිඟ දුරකථන වියදම රු.14,503 ක් වූ අතර රු.5,000 ක මුදලක් පමණක් 2013 දෙසැම්බර් 30 දිනට ගෙවා තිබුණි. මේ අනුව තවදුරටත් අයවිය යුතු රු.9,503 ක් වූ හිඟ මුදල 2014 පෙබරවාරි වන විටත් ලේකම්වරයා විසින් ගෙවිමට කටයුතු කර නොතිබුණි.

2.4 අවිධිමත් ගනුදෙනු
----------------------

සභාව විසින් පවත්වාගෙන යනු ලබන දකුණු කළුතර පෙර පාසල සම්බන්ධයෙන් 2013 නොවැම්බර් 27 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) 2013 වර්ෂයේදී පෙර පාසැලට ළමුන් ඇතුළත් කිරීමේදී සභාවේ කිසිදු අනුමැතියකින් තොරව එක් ළමයෙකුගෙන් රු.600 බැගින් රු.45,000 ක මුදලක් අයකර ගෙන තිබූ බව 2013 නොවැම්බර් 27 දින කරන ලද පරීක්ෂණයේදී අනාවරණය විය. මෙසේ

අයකරගෙන තිබූ මුදල් කිසිදු බැංකු ගිණුමක තැන්පත් කර නොතිබූ අතර පෙර පාසැලේ දරුවෙකුගේ මවක භාරයේ රඳවාගෙන තිබුණි. මේ ආකාරයට මුදල් අයකිරීම වර්ෂ ගණනාවකට පෙර සිට වාර්ෂිකව සිදු කරගෙන ගොස් තිබූ බවද අනාවරණය විය.

(ii) මෙසේ අයකරගන්නා මුදල් වර්ෂය අවසානයේ පැවැත්වෙන පෙර පාසැල් විවිධ ප්‍රසංගයේ ආහාර වියදම් හා වෙනත් සුළු වියදම් වෙනුවෙන් දරන ලද බව අනාවරණය විය. එසේ වුවද මෙසේ වාර්ෂිකව අයකර තිබූ මුදලින් වියදම් වූ මුදල සම්බන්ධව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ අතර විගණන පරීක්ෂණයෙන් සති 2 1/2 කට පසු 2013 දෙසැම්බර් 12 දින සභාවේ පෙර පාසැල් පාලිකාව සහ මුදල් රඳවා තබාගෙන තිබූ තැනැත්තිය විසින් රු.36,601 ක බිල්පත් විගණනයට ඉදිරිපත් කරන ලදී.

(iii) මේ ආකාරයට වර්ෂය අවසානයේ පැවැත්වෙන පෙර පාසැල් විවිධ ප්‍රසංගය වෙනුවෙන් වර්ෂය ආරම්භයේ දී මුදල් එකතු කර වර්ෂයක් පුරා අත රඳවා ගෙන තිබූ බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

(අ) <u>**කළුතර උතුර ෆොන්සේකා පෙදෙස තාර දැමීම**</u>

ඉහත මාර්ගය අඩි 15 ක් පළලට අඩි 1160 ක් දිගට තාර දැමීම සඳහා රු.928,944 ක ඇස්තමේන්තුවක් 2012 සැප්තැම්බර් 26 දින අනුමත කර කර්මාන්තය සෘජු ශ්‍රම පදනම යටතේ සිදු කර තිබුණි. 2014 ජනවාරි 02 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) අනුමත නොවූ ඇස්තමේන්තුවක් සඳහා සභාව විසින් ද්‍රව්‍ය නිකුත් කර තිබුණි.

(ii) මෙම මාර්ගය දිග මීටර් 343.5 ක් ද, (අඩි 1126.7) සාමාන්‍ය පළල මීටර් 5.6 ක් ද (අඩි18.4) වුවත් වැඩ අධිකාරී විසින් ලබා ගෙන තිබූ මිණුම් වාර්තා අනුව එහි දිග මීටර් 353.65 ක්ද, (අඩි 1160) පළල මීටර් 5.4 ක් ද (අඩි 18) ලෙස දක්වා තිබුණි.

(iii) පළමු වර තාර ආලේපනය සිදු කර සති 2 ක් ඇතුළත දෙවන වර තාර ආලේපනය සිදු කළ යුතු වුවත් මෙම මාර්ගයේ පළමු වර තාර ආලේපනය සිදු කර විගණිත දිනය වූ 2014 ජනවාරි 03 වන විට මාස 7 ක කාලයක් ගත වී තිබුණද රු.275,583 ක් ඇස්තමේන්තු කර තිබූ දෙවන වර තාර ආලේපනය සිදු කර නොතිබුණි.

(iv) ද්‍රව්‍ය හා ශ්‍රම අවශ්‍යතා ලැයිස්තුවට අනුව දිග අඩි 1160 ක් හා පළල අඩි 18 ක් වූ කර්මාන්තය ඉටු කිරීමට නුපුහුණු ශ්‍රම දින 275 ක් අවශ්‍ය වන බව දක්වා තිබූ අතර චෙක්රෝල පරීක්ෂාවේදී ඒ සඳහා දින 316 ක් යොදාගෙන රු.252,800 ක මුදලක් ගෙවීම් කර තිබීමෙන් වැඩිපුර දින 41 ක් සඳහා රු.32,800 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) <u>**කළුතර දකුණ සමරනායක පෙදෙස තාර දැමීම**</u>

ඉහත මාර්ගය දිග අඩි 325 ක් හා පළල අඩි 20 ක් සඳහා රු.501,344 ක වියදම් ඇස්තමේන්තුවක් 2012 ජූනි 26 දින අනුමත කර තිබුණි. ව්‍යාපෘතිය සෘජු ශ්‍රම පදනම යටතේ සිදු කර තිබූ අතර 2014 ජනවාරි 04 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) චෙක්රෝලයට අනුව 2013 ජූලි 17 ආරම්භ වී ජූලි 28 දක්වාද, නැවතත් සැප්තැම්බර් 20 සිට 30 දක්වා ව්‍යාපෘතිය සිදු කර අවසන් කර තිබුණද වැඩ නිමි වාර්තා සකස් කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු මිණුම් වාර්තා ලබා ගෙන නොතිබුණි.

(iii) මෙම මාර්ගයේ දිග මීටර් 78.9 (අඩි 259) ක්ද, අවස්ථා 9 කදී ගත් මිණුම් අනුව සාමාන්‍ය පළල මීටර් 5.6 (අඩි 18) ක් වූ අතර මිණුම් වාර්තා ලබා ගෙන නොතිබීම නිසා සැසඳීමක් කිරීමට නොහැකි විය.

(iv) පළමුවර තාර ආලේපනය 2013 සැප්තැම්බර් 30 අවසන් කර තිබුණද පළමු වර තාර ආලේපනයෙන් සති 2 ක් ඇතුළත දෙවන වර තාර ආලේපනය සිදු කළ යුතු විය. ඒ සඳහා

අනුමත ඇස්තමේන්තුවේ රු.98,778 ක් වෙන් කර තිබුණද විගණිත දිනය වූ 2014 ජනවාරි 03 වන විටත් දෙවන වර තාර ආලේපනය සිදු කර නොතිබුණි.

2.6 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------------------

2.6.1 <u>නිරවුල් නොකළ ගිණුම්</u>

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන විදුලිය ණයගැති රු.2,471,702ක් හා තානායම් ආදායම රු.991,283 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයකට, පුද්ගලයෙකුට හා තක්සේරු ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.438,900, රු.62,000 හා රු.1,046,657 ක් 2001 වර්ෂයේදී ණයහිමියන් ලෙස ප්‍රතිපාදනය කර තිබුණ ද විගණිත දිනය වූ 2014 ජුලි 24 වන විටත් ඒවා නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1995 වර්ෂයට පෙර සිට පැවත එන හඳුනා නොගත් රු.137,726 ක අත්තිකාරම් ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.6.2 <u>වත්කම් කළමනාකරණය</u>

(අ) නෙදර්ලන්ත රජයේ ආධාර යටතේ බස්නාහිර පළාතේ හා තෝරාගත් නාගරික ප්‍රදේශ ඇතුළු ආපදා ප්‍රතිචාර පද්ධති 18 ක් වැඩි දියුණු කිරීමේ විදේශ ආධාර ව්‍යාපෘතියේ (ORET) 2006 සිට 2008 දක්වා ව්‍යාපෘති අදියර I යටතේ සහ 2009 සිට 2010 දක්වා ව්‍යාපෘති අදියර II යටතේ ලබාදී තිබූ නොයෙක් වර්ගයේ වාහන 7 ක් සහ යන්ත්‍ර උපකරණ හා අමතර උපාංග ඇතුළත් රුපියල් මිලියන 204 ට වැඩි වටිනාකම ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාරව ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනයක සටහන් කර නොතිබුණි.

(ආ) ගිනි නිවන සේවා අංශයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධව මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව කළ යුතු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් 2008 වසරේ සිට විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2013 නොවැම්බර් දක්වාම සිදු කර නොතිබුණි.

(ඇ) සභාව සතුව පවත්නා වූ සියළුම ගොඩනැගිලි හා ඉඩම් පිළිබඳව විස්තර ඇතුළත් විධිමත් ලේඛනයක් පවත්වා ගෙන යාමට 2013 නොවැම්බර් 30 දිනය වූ විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතුව පවත්නාවූ ඉඩම් සම්බන්ධව අදාල හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සඳහා 2014 ජනවාරි 03 දින විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කළ නමුත් අදාල ඔප්පු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.6.3 <u>අත්තිකාරම් පියවීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) 1995 වර්ෂයට පෙර සිට 2013 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබූ එකතුව රු.6,088,166 ක් වූ අත්තිකාරම් විගණිත දිනය වූ 2014 ජුලි 24 වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. අත්තිකාරම් පියවීමේදි රු.10,480 ක් වැඩියෙන් අයකර තිබූ අතර නොපියවූ අත්තිකාරම් ශේෂය තුළ හඳුනා නොගත් රු.137,726 ක ශේෂයක් ද විය.

(ii) හිමිදිරියාව ආදාහනාගාරය ඉදි කිරීම වෙනුවෙන් 2008 ඔක්තෝබර් 09 දින ලබා දී තිබූ රු.1,000,000 ක් වූ අත්තිකාරම් එම ආයතනයට ගෙවිය යුතු වටිනාකමින් අඩු කර බිල්වල සඳහන් කර තිබුණද අත්තිකාරම් ගිණුමෙන් එම වටිනාකම ගැලපුම් කර නොතිබුණි. ඉදි කිරීම වෙනුවෙන් තවදුරටත් ගෙවිය යුතුව තිබූ රු.1,511,827 (15% එකතු කළ අගය මත

බදු ඇතුළත්ව) ප්‍රමාණයද ගිණුම් ගත කිරීමට හෝ ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 1998 වර්ෂයේ මස් වෙළඳසැල් කුලී ආදායම් වෙනුවෙන් ලැබී තිබූ රු.72,127 ක් වූ චෙක්පත් 03 ක් හා 2000, 2001, 2002 වර්ෂවල වරිපනම් බදු ආදායම් වෙනුවෙන් ලැබී තිබූ රු.20,984 ක් වූ චෙක්පත් අගරු වී තිබූ අතර ඒවා අයකරගැනීමට කටයුතු කිරීමෙන් තොරව නොපියවූ අත්තිකාරම් ලෙස ගිණම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.6.4 **අනවසර ඉදිකිරීම්**

අනවසර ඉදිකිරීම් සටහන් කර තිබූ ලේඛන අනුව 2013 නොවැම්බර් 30 වන විට අනවසර ඉදිකිරීම් 68 ක් වාර්තා වී තිබූ අතර අනවසර ඉදිකිරීම් අත්හිටුවන ලෙස අදාල පාර්ශවයන්ට ලිඛිතව දැනුම් දී තබුණද, ඒ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

2.6.5 **කාර්යය මණ්ඩල කළමනාකරණය**

(i) 2013 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරුවල සේවකයින් 35 දෙනෙකු ඌණතාවයක්ද , සේවකයින් දෙදෙනෙකුගේ අතිරික්තයක්ද විය.

(ii) සභාවේ ලේකම් තනතුර වර්ෂ ගණනවක සිට පුරප්පාඩුව පැවතුණි.

(iii) 2007, 2008 හා 2011 වර්ෂවලදී ආදේශක පදනම මත බඳවාගෙන තිබූ සෞඛ්‍ය උපදේශක/ උපදේශිකාවන් හතර දෙනෙකු සෞඛ්‍ය උපදේශන කටයුතුවලට නොයොදවා විගණිත දිනය වන දෙසැම්බර් 30 දින වන විටත් ආදායම් අංශයේ රාජකාරි කටයුතුවල යොදවා තිබුණි.

2.6.6 **වාහන පාලනය**

(අ) සභාවේ නාගරික මන්ත්‍රීවරු විසින් 2013 පෙබරවාරි 23 දින සිට දෙසැම්බර් 15 දක්වා කාලය තුළ සභාපතිගේ/ ලේකම්ගේ උපදෙස් පරිදි යැයි සඳහන් කර වාහන 4 ක් කිලෝ මීටර් 17684 ක් දුර වූ ගමන් සඳහා යොදා ගෙන තිබූ අතර මෙම ගමන් සඳහා ඔවුන්ගේ රාජකාරී සම්බන්ධ ලිඛිත සාක්ෂි කිසිවක් නොතිබුණි. තවද, ඉහත අවස්ථාවල වාහනය භාවිතා කළ බවට ධාවන සටහන්වල කෙටි අත්සන් යොදා නොතිබුණි.

(ආ) සභාවට අයත් වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරීක්ෂණයක් සිදු කර නොතිබුණි

(ඇ) 2013 වර්ෂයේ සභාවේ කිසිදු වාහනයකට අදාල මාසික සාරාංශ සකස් කර නොතිබූ අතර වාහන 05 කට අදාලව මාස 2 සිට මාස 9 1/2 අතර කාලයකට අදාල ධාවන සටහන් 2013 දෙසැම්බර් 31 දින දක්වාත් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඈ) නගර සභා බල ප්‍රදේශයෙන් පිටත ගිනි නිවීමේ සේවා සැපයීම අළුතෙන් ඉදි කරන ගොඩනැගිලි සඳහා ගිනි අවදානම් නිවාරණ සහතික ලබාදීම, ගොඩනැගිලි සැළසුම් සහ ගිනි ආරක්ෂණ පද්ධති සහතික කිරීම, ගිලන් රථ සේවා සැපයීම, ගිනි නිවන සේවා පුහුණු සැසි පැවැත්වීම යනාදී කටයුතු වෙනුවෙන් සභා තීරණයක් අනුව ගාස්තු අයකරගෙන ඇතත්, ඒ සඳහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගෙන නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධත හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(i) ආදායම් පරිපාලනය
(ii) වත්කම් කළමනාකරණය
(iii) කොන්ත්‍රාත් පරිපාලනය
(iv) අයවැය පාලනය